**උද්භිද උද්‍යාන භාර අරමුදල - 2019**
**-----------------------------------------**

## 1.1 අහිතකර මතය

**-----------------**

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3 වගන්තිය සහ 1996 දෙසැම්බර් 20 දිනැති උද්භිද උද්‍යාන භාර අරමුදලේ විශ්වාසය පල කිරීමේ ඔප්පුවේ 4 (ඒ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන්, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

**---------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුමත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය ප්‍රකාරව වත්කම්, දේපල පිරියත උපකරණ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, අරමුදල විසින්, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ එහි පරිපාලන කටයුතු සඳහා තබාගෙන ඇති සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.560,010,287 ක් වූ දේපල පිරියත හා උපකරණ අරමුදලේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම අරමුදලේ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම 2006.12.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව ආරම්භයේ සිටම වියදම් හැරුණු විට වත්කම්, වගකීම්, ආදායම් යන කොටස් නාමිකව හදුනාගෙන අවසන් ගිණුම් සකස් කිරීම මේ දක්වා සිදුකරගෙන ගොස් ඇති බව දන්වා සිටිමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 2 ක දී උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා දරන ලද අයභාර ස්වරූපයේ රු.382,905 ක වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් සැකසීමේදී එම දෝෂය නිවැරදි කර වියදම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ටිකට්පත් ආදායම රු. 360,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මාර්ගෝපදේශ පත්‍රිකා හා මල් වගා පොත් ලැබිය යුතු ආදායමරු. 401,115 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායම් ද්විගණනය වී ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | තොග වාර්තා අනුව 2019 ජනවාරි 01 දිනට ශාකාගාරයේ මල් වගා උපදෙස් පත්‍රිකා තොගයේ පිරිවැය රු. 394,200 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක තොගයේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබීම නිසා වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින්ම අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ඉකුත් වර්ෂයේ රු. 565,940 ක මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා ආදායම දෙවරක් ආදායම ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කර නොතිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදිකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායම් ද්විගණනය වී ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| මල් වගා පොත් තොගය | 2,990,568 | 2,883,474 | 107,094 | තොග සම්බන්ධව තවදුරටත් ඉදිරි තොග ගණනයන් සිදුකර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරන බව දන්වා සිටිමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැඟිලි සංවර්ධන ක්‍රියාකාරකම් හා ඉඩම් සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පිළිවෙලින් | මෙම සටහන් නැවත නිවැරදි කරමින් එකින් එක වත්කම වෙන් වෙන්ව හඳුනාගැනීමට හැකිවන ලෙස සටහන් තැබීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වත්කම් ප්‍රග්ධනිත කිරීමේදී නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

එකතුව රු. 6,923,907 ක් හා රු.6,957,916 ක් ලෙස වත්කම් යටතේ නිරූපනය කරන ලද වටිනාකම්වලට අදාළ වත්කම කුමක්ද හා ඊට අදාළ ගෙවීම් වවුචර්, බිල්පත් යන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතුයි. එසේ වුවද, වසා දැමීමට කටයුතු නොකර 2019 මාර්තු 01 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේදී මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස පත් කර ඉදිරියටත් පවත්වාගෙන යාමට සාකච්ඡා කර තිබූ නමුත් 2020 මැයි 31 දින වන විටත් එම ව්‍යවස්ථාපිත අරමුදල පිහිටුවා නොතිබුණි. | 2019.03.01 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ දී පැවති සාකච්ඡාවේදී මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ඉදිරියටත් පවත්වා ගැනීමට කටයුතු කිරීමත්, එතෙක් අරමුදලේ කාර්යයන් ඉදිරියට පවත්වා ගැනීම සුදුසු බවටත් කරුණු සාකච්ඡා විය. | මෙය ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස ස්ථාපිත කිරීමට හෝ ඇවර කිරීමට කටයුතු කළ යුතු වීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.103,488,041 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.119,721,992 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,233,951 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත ආදායම රු.18,199,819 කින් අඩු වීමත් මූල්‍ය හා වෙනත් වියදම් රු.3,798,758 කින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.